ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකඃ 2477424, 2477423, 2477311
ෆැක්ස්ඃ 2346257, 2477739
ඊ-මේල්ඃ dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියඃ www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2019 මාර්තු 07 |

## ඉඩම් මිල දර්ශකය - 2018 වසරේ දෙවන භාගය


### සුවිශේෂී කාර්යසාධනයන්

**ඉඩම් මිල දර්ශකයෙහි වර්ධනය : 18.0%**
(වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත)

**අනු දර්ශකයන්හි වර්ධනය**
(වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත)

| | |
|---|---|
| නේවාසික ඉඩම් මිල දර්ශකය | 17.2% |
| වාණිජ ඉඩම් මිල දර්ශකය | 17.4% |
| කාර්මික ඉඩම් මිල දර්ශකය | 19.4% |

**ඉඩම් මිල දර්ශකය සහ එහි අනු දර්ශකයන්හි විචලනය**




**2017 වසරේ සිට ඉඩම් මිල දර්ශකයේ භූ ගෝලීය ආවරණය : කොළඹ දිස්ත්‍රික්කය**




2018 වසරේ දෙවන භාගය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් කොළඹ දිස්ත්‍රික්කය ආවරණය කරමින් ගණනය කරන ලද ඉඩම් මිල දර්ශකය 125.9 ක අගයක් වාර්තා කරන ලද අතර එය 2017 වසරේ දෙවන භාගයේ වාර්තා වූ අගයට සාපේක්ෂව සියයට 18 ක වර්ධනයකි. නේවාසික, වාණිජ හා කාර්මික යන ඉඩම් මිල දර්ශකයේ අනු දර්ශක තුනෙහිම ඉහළ යාම මෙම වර්ධනය සඳහා හේතු විය.

නිශ්චල දේපළ අංශයේ වර්ධනයන් අධීක්ෂණය කිරීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන පර්චසයක් සඳහා වන මිල ගණන් උපයෝගී කර ගනිමින් කොළඹ දිස්ත්‍රික්කයේ[1] සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි ඉඩම් මිල දර්ශකය සම්පාදනය කරනු ලැබේ. මෙහිදී ඉඩම් භාවිතය සම්බන්ධයෙන් වන විවිධත්වය සැලකිල්ලට ගෙන සමජාතීත්වය පවත්වා ගැනීම සඳහා නේවාසික, වාණිජ සහ කාර්මික යන ඉඩම් කාණ්ඩ සඳහා අනු දර්ශක තුනක් ගණනය කරනු ලබන අතර, එම අනු දර්ශක තුනෙහි සාමාන්‍යය ඇසුරෙන් ඉඩම් මිල දර්ශකය ගණනය කරනු ලැබේ.

---

[1] කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5 ක් ආවරණය වන පරිදි 1998 සිට 2017 දක්වා ඉඩම් මිල දර්ශකය සම්පාදනය කරන ලදී. මෑත කාලීනව නිශ්චල දේපළ අංශයේ ඇති වූ වර්ධනය හේතුවෙන් ඉඩම් මිල ගණන් අධීක්ෂණය කිරීමේ වැදගත්කම වැඩි වීමත් සමඟ කොළඹ දිස්ත්‍රික්කයේ සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ඇතුලත් වන පරිදි මෙම දර්ශකයේ භූගෝලීය ආවරණය පුළුල් කරන ලදී. පදනම් වර්ෂය සංශෝධනය කරන ලද මෙම නව ඉඩම් මිල දර්ශකය 2017 වසරේ සිට අර්ධ වාර්ෂිකව ගණනය කෙරේ.

## ඉඩම් මිල දර්ශකය සහ වාර්ෂික ලක්ෂමය පදනම මත විචලනය

| කොළඹ දිස්ත්‍රික්කය සඳහා ඉඩම් මිල දර්ශකය<br>(පදනම් වර්ෂය: 2017 වසරේ පළමු භාගය) | 2017: පළමු භාගය | 2017: දෙවන භාගය | 2018: පළමු භාගය | 2018: දෙවන භාගය | වාර්ෂික ලක්ෂමය පදනම මත විචලනය (සියයට)<br>2018: පළමු භාගය | වාර්ෂික ලක්ෂමය පදනම මත විචලනය (සියයට)<br>2018: දෙවන භාගය |
|---|---|---|---|---|---|---|
| නේවාසික ඉඩම් මිල දර්ශකය | 100.0 | 107.0 | 116.5 | 125.4 | 16.5 | 17.2 |
| වාණිජ ඉඩම් මිල දර්ශකය | 100.0 | 107.3 | 116.8 | 125.9 | 16.8 | 17.4 |
| කාර්මික ඉඩම් මිල දර්ශකය | 100.0 | 106.0 | 115.8 | 126.6 | 15.8 | 19.4 |
| ඉඩම් මිල දර්ශකය | **100.0** | **106.7** | **116.3** | **125.9** | **16.3** | **18.0** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව